# තෘෂ්ණාව



සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

දක්ෂිණ ලංකා, තිස්ස විහාරය, සිඳුජයපුර, කිරින්ද.

# පොඩි නම, සරසවි ගියාට කම් නෑ, එහෙත්...

## අඹේපුස්සේ සුමංගල හිමි

**(1985.10.20 බුදුසරණ)**

එද ගිහිගේ තිබුන එකනොව කෝටියක් කම්කටොලු අතහැර
තමන් සැනසී අනුන් සනසමි කියන අදිටන හදේ රජකර
උතුම් වූ බුදු පියාගේ කහ සිවුරු දරමින් රටට වැඩකර
හෙට උදේ සරසවි වඩින පොඩි සමිඳුගේ පා වදිමි අවසර

කොතෙක් විෂයන් තිබුන මුත් දම් විනය දෙක හොඳ හැටි බලා
හොඳින් සිප්සත හදරනු මැන ලොවට මෙත් කරුණා හෙලා
සසර දුක්බිය නසා මොක් පුර රන් පියුම් ගන්නට නෙලා
ගමේදයක දයිකාවන් සිටිති ඔබ එන තුරු බලා

නිසරු දෙය සරුයයි සිතා ගිනි ගන්න පලඟැටියන් මෙනේ
රගන මුත් මාරදූවරු හා පුතුන් නෙක ගොස කර මීනේ
පැවිදි වු ද වූ පොරොන්දුව නිතර සිහියට නග මීනේ
ඔබ වහන්සේ මෙනෙහි කළ මැන බුදු පුතෙකි මා සාසනේ

සිවුරු පටියට පාත්තරයක වැඩිය නිදහස තිබේ නිවසක
තියා සමහර විට සිතෙන්නට හැක උපාදිය ලැබු දවසක
එහෙම හිතමින් ගමන් මග යොමු කළෝතින් හෙම නුහුරු වෙනතක
අහෝ වැහුනා නිවන් දෙරටුව ඔබේ නෑදෑ සතර කුලයක

# තෘෂ්ණාව

(අංක 03)

සම්පාදක

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

# නමො තසස භගවතො අරහතො සමමා සමබුඩසස!!!

ශ්‍රී බුඩ වර්ෂ 2554-07-03 බුධ දින ක්‍රි.වෂී 2011-12-14 බුඩ, ධමම, සංඝ යන ත්‍රිවිධ රත්නයෙන් මට සමාව ලැබේවා !!!

ප්‍රාණඝාතය නොහොත් අලජ්ජකම

''අල්ල චමම පටිච්ඡන්නො - නවද්වාරො මහාවණො, සබ්බත්තො පග්ඝරති - අසුචි පූතිගන්ධියො''යි. මෙහි තේරුම :- මෙම දෙතිස් කුණුපය නොහොත් කුණු ශරීරය නම් අල්ලචර්මයයි කියන ලද තෙත්වූ කුණු හමකින් ආවරණය වී තිබෙන්නේය. සෙම්, සොටු, මළ, මුත්‍ර, කබ, කඳුළු වැහෙන නවද්වාරයක් ඇත්තේය. ප්‍රතිකර්ම කලාට සුවපත් කිරීමට නොහැකි බැවින් අසාධ්‍ය මහ වණයක් වැනි වූයේය. නුවණැත්තන් විසින් පිළිකුල්කරණ බැවින් අසුචි ගොඩක්ම වන්නේය.

එය එසේම ජීවත්ව සිටියදී නම්, මළපසු කෙසේද? කරුණු කාරනා මෙසේ බැවින් මෙලොව වශයෙන් මේසා මහත් දුකක් පිළිකුලක් ද පරලොව වශයෙන් ද අපගෙ පියවි ඇසට (මසැසට) නොපෙනෙන අනන්ත අප්‍රමාන අතිදීර්ඝ කාලයන්ට මහත් දුක් හෝ සැප ලබා ගැනීමට සැපයෙනුත් සැපය වූ නිර්වාණ සම්පත්තිය සඳහා යොදවා ගැනීමට මාර්ගය බුදු දහම තුළින් පෙන්වා දී තිබෙනවානම් මහා බුද්ධිමත් මිනිසා වූ අප නුවණින් කුණු ශරීරය තේරුම් ගෙන අපගේ මේ ශරීර කුඩුව තුළ හෘද

වස්තුව තුල සැඟ වී සිටින සිත නොහොත් චිත්ත සන්තානය මනා ලෙස පාලනය කරගෙන හොඳ මගට යොමු කර ගැනීමට උත්සාහවත් විය යුතු. නිරන්තරයෙන් දුක් දෙන මේ ශරීරය විසින් ප්‍රාණඝාතය කරන්නේය, හොරකම් කරන්නේය, පරදර සේවනය ද කරන්නේය. එකී කාරනා තුනම මිනිසත් බවට නොගැලපෙයි, තිරිසන් අපාගත සත්වයන් විසින් පමණක් කර එකී පිළිකුල් ක්‍රියාවන් කිරීමට මෙකී ශරීරය පොළඹවන්නේ හෘදවස්තුව තුළ නොපෙනෙන චිත්ත චෛතසිකයයි.

අපගේ සිතින්ම සිත බලා සිතට වහල් නොවී සිත පාලනය කර ගැනීමට බුද්ධිමත් මිනිසා එනම් සෝවාන් ඵලයට පත් උනා වූ හෝ එසේ වීමට හේතු සම්පත් වඩාගෙන යන උතුම් මිනිසා මෙසේ සිත පාලනය කර ගනී. මොනම හේතුවක් නිසාවත් මම ප්‍රාණඝාතය නොකරමි. කෙතරම් අගහිඟකම් දුක් ගැහැට පැමිණියත් අන්සතු වස්තුවක් සොර සිතින් නොගනිමි. එසේම මෙලොව පරලොව මහත් විපාක දුක් දෙන පහත් මිනිසුන්ගේ තිරිසන් ක්‍රියාවක් වූ පරදර සේවනයෙහි නොයෙදෙමියි ස්ථිරවම සිත පිළිකුලට යොමා මැනවින් සිත පාලනය කරගෙණ උතුම් ශ්‍රේෂ්ඨ උත්තමයෙක් බවට පත්ව ජීවත් වෙමින් මේ කුණු ශරීරය සජීයා හැව දමා යන්නා සේ මරණින් මතු දුගතියෙන් තොර සුගති ආත්ම භාවයක උපත ලබන්න සුදුසු පුද්ගලයෙක් වේ.

එම පහත් ක්‍රියාවන් තුනෙන් වැළකුන උතුම් මිනිසාට තවදුරටත් ශරීරයට අයත් මුඛයෙන් කෙරෙන ප්‍රධාන වැරදි වන බොරුකීම, පරුෂ වචන කීම, කේලාම් කීම, හිස්බොල් වචන කීම පාලනය කරගත හැකිය. ඒවා එසේ පාලනය කිරීම තුළින් කට, දිව පිණවන ප්‍රාණඝාතයට අනුබලදෙන නොකට යුතු වෙළඳාමෙන් සහ මස් මාංසවලට තිබෙන ගිජුකම නොහොත් අලජ්ජී භාවයෙන් වැළකීමටත් එම සිල්වත් හිත යොමු

කරනවා පමණක් නොව, අටසිල්, දස සිල්, උපසම්පද සිල් ගුණ ද රක්ෂා කිරීමට සුදුස්සෙක් වෙයි.

එවන් උත්තමයා මුළු සත්ව සන්හතියටම සම්පතකි. මිනිසාට පමණක් නොව තිරිසන් සතුන්ට ද දෙවියන්, භූතයන්ට ද ප්‍රියමනාප ආදශීමත් කෙනෙක් නිසා ඔහුට හෝ ඇයට කිසිවෙකුගෙන් හෝ හිංසාවක් පීඩාවක් නොවේ. රජයෙන් හෝ ආරක්ෂක අංශයන්ගෙන් කරදරයක් පීඩාවක් නොවේ. ඔහුගෙ අවසාන කාලය බොහෝ සේ සතුටින් ගෙවා හොඳ සුගතිගාමි ආත්මයක් ලබා බුදෙධාත්පාදකාලයක් ලැබූ කල්හි සියලුම සංසාර දුකින් මිදී ලබන අති උතුම් නිර්වාණ සම්පත්තිය ද ලබයි.

එසේ නොමැතිව සිතට වහල් වී සිත පාලනය කර ගැනීමට නොහැකි පුද්ගලයා වල්මත් වී තන්නත්තාරේ යමින් මෙලොවත් පරලොවත් බලවත් දුකටම පත්වේ. එය එසේ වන්නේ අනන්ත සසරේ කරගෙන ආ පහත් ක්‍රියාවන් නොහොත් සතර අපායන්ම තම එකම නිවස බවට එම නිවසටම නැවත නැවත යාම. උපමාවක් වශයෙන් කීවොත් හිරගෙදරට පුරුදු පුහුණු වූ මිනිසා හිර ගෙදරින් නිදහස් වී එළියට පැමිණියාම නැවත ඉතා ඉක්මණින් හිරගෙදරටම යාමට ක්‍රියා කිරීමක් වශයෙනි. එය ගම් ඌරාට අසුචි ප්‍රිය මනාප වීම මෙනි.

මෙතෙක් පෙන්වූයේ ශරීරයෙන් සහ මුඛයෙන් කරගන්නා වූ පාපකර්මයන් සහ එයින් වැළකී යහමගට යොමුවීමෙන් ඇතිවන සැප සම්පත් ය. ඊට අමතරව සිතෙන් ද කෙරෙන ප්‍රධාන පාපකර්ම තුනක් සහ පෙරකී ආකාරයටම මෙකියන පාප සිතිවිලි වෙනුවට එහි අනෙත් පැත්ත වූ යහපත් සිතිවිලි උපදවා ඒ අනුව ජීවිතය හැඩගස්වා මෙවන් විෂම සමාජයක් තුළ කෙසේ හෝ කෙටිකලක් හෝ ජීවත්ව සිට මිය පරලොව

ගියත් සතර අපායොත්පත්තියකට නම් වැටෙන්නේ නැත. එයම ජීවිතය ජය ගත්තා වන්නේය. එනම් සිතෙන් කෙරෙන අකුසල ලෝභ- දෙවෂ - මොහ ලෝභය නම්:- අලජ්ජ භාවය නොහොත් තෘෂ්ණාව නොහොත් කෑදරකම නොහොත් පෙරේතකම,. නොකා - නොබී. ගතට හරියාකාර වස්ත්‍රයක් වත් නැතිව තිරිසන් සතකුටවත් කන්න ටිකක් නොදී කන තමන් දනයක් දෙනවා නොව අන්‍යයන් දනයක් දෙනවා දැක්කත් එයටත් ඊර්ෂ්‍යාව උපදවන නොයෙක් ද, කියන තව තවත් තිබෙන ගොඩටම එකතු කරමින් ද තවතවත් එකතු කිරීමට සිතමින් ද සිට කිසිවෙක් බලාපොරොත්තු නොවන වේලාවක මිය ගොස් එම වස්තු තෘෂ්ණාවෙන්ම මළ පෙරේතයෙක්, මළයකෙක්, කුම්භාණ්ඩයෙක් හෝ බලුකපුටු ආත්ම භාවයක් ලබා උපදිති.

දෙවෂ:- අන්‍යයන් කෙරෙහි ඇතිකර ගන්නා වූ දෙවෂය නොහොත් කෝපය නොහොත් වෛරය හේතු කොටගෙන එය සිත් තුල රඳවා ගන්නාතෙක් සතුරාට වඩා තමන්ම නිරන්තරයෙන් පීඩාවට පත් වන්නේය. නිතරම තම සිතෙහි බලපවත්වන්නා වූ තරහව සහ පළිගැනීමේ චේතනාව නිසා සිතට කිසිම ප්‍රීතියක්. උපදවන්නේවත්, කරන කියන රැකී රක්ෂා වෙළඳ, ගොවිතැන් බත් ආදි කිසිවක් කෙරෙහි සිතයොමු නොවීමෙන් ද එකී ව්‍යාපාරයන් අසාර්ථක තත්වයට පත්වන්නේය. මිතුරන් වෙනුවට සතුරන් ඇති වන්නේය. කාලය ධනය, ශ්‍රමය දෙවෂය නිසා ඇතිකරගන්නා වූ සතුරාගෙන් පළිගැනීමට වැය වන්නේය.


**මෝහය :-** නොහොත් මාන්නය නොහොත් උඩඟුකම නොහොත් උද්ධච්චකම තමා කෙළෙස් සතුරන් 1500 න් අංක එකට සිටින සතුරා. වෛරයේ සහ පළිගැනීමේ චෙතනාව ක්‍රියාත්මක කරවන්නේ මෙකී,

මොහය නොහොත් මුලාව නොහොත් අවිද්‍යාව සෑම විපතකටම මූලිකයාය. ද්වේෂයෙන් කෙරෙන සෑම පසුතැවිල්ලක්ම සාද දෙන්නේ ඉහත කී ද්වේෂ, මොහ සතුරන් දෙදෙනාය.

මෙකී මෝහය නිසා තමයි පඤ්චශීලය බිඳ ගන්නේ. එයින් මෙලොව පරලොව වන්නා වූ මහත් දුක් විපාක මොහොතකටවත් අවබෝධ වීමේ ප්‍රඥාවක් තිබේ නම්, කිසිවිටෙකත් එම ප්‍රධාන සිල්පද පහෙන් එකක් හෝ බිඳින්නේ නැත. එමනිසා තමයි බුදුරජාණන් වහන්සේ ගිහිපින්වතුන්ට ප්‍රධාන වශයෙන් පඤ්චසීලය පනවා වදාළෙ.

දැන් අප පෙන්වාදෙන්ට අදහස් කරණ මාතෘකාව වශයෙන් ගන්නේ ප්‍රාණඝාත අකුසලයයි. එහි මුලින්ම සඳහන් කරන්නේ 2011 දෙසැම්බර් 13 වැනි අඟහරුවාද ලංකාදීප පුවත්පත් වාර්තාවකි. එනම් ගව පැටවුන් 30 ක් හිංසාකාරීව මසට ගෙනයද්දී අත් අඩංගුවට ගැනීම පිළිබඳ ප්‍රවෘත්තියකි එම පුවත සමග ඡායාරූපය පහත පළ වේ.

ගව පැටවුන් 30 ක් හිංසාකාරීව මසට ගෙන යද්දී අත්අඩංගුවට සැකපිට 9 ක් පොලිස් භාරයට



මස් පිණිස මැරීමට ගෙන යද්දී පොලීසියට හසුවූ ගව පැටවුන් තිස් දෙනෙකු හිංසාකාරී ලෙස ලොරියකින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයින් සිව් දෙනෙක් අත්අඩංගුවට ගත් බව මිහින්තලේ පොලීසිය පවසයි. මේ සතුන්ගේ මස් නත්තල් සතියේ එළුමස් ලෙස අළෙවි කරන්නට සිටි බව ද පොලීසිය කීය.

කහටගස්දිගිලිය, කිරිඉබ්බෑවේ සිට වැලිසරට මෙම ගව පැටවුන් ප්‍රවාහනය කරමින් තිබූ ලොරිය මිහින්තලේ පොලීසියේ නිලධාරීන් විසින් ඊයේ (12) අළුයම 2.00 ට පමණ අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ මිහින්තලේට නුදුරු වේලන්කුලම හන්දියේදී ය.

මේ සතුන් මාස හයට අඩු වයසේ කිරි බොන පැටවුන් බව වැටලීම සිදුකළ පොලිස් නිලධාරීහු පවසති. මාස දෙකේ තුනේ වයසේ පැටවුන් ද ඒ අතර සිටින බව ඔවුහු කියති.

මේ ගව පැටවුන් ද ගව පට්ටිවලින් සොරකම් කර ඇතැයි සැකකරන බව කී වැටලීම කළ පොලිස් නිලධාරීහු එය අනාවරණය කර ගැනීම සඳහා වැඩිදුර පරීක්ෂණ සිදුකරන බව කීහ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සිව් දෙනාම වැලිසර ප්‍රදේශයේ පදිංචිකරුවෝ බව ප්‍රශ්න කිරීමේ දී හෙළි වී ඇත. ඔවුන් ඊයේ (12) අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

මිහින්තලේ පොලීසියේ නියෝජ්‍ය ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඉන්දික රණතුංග මහතාගේ මෙහෙයවීමෙන් සිදුකළ මෙම වැටලීමට සැරයන් නිමල් (27477), කොස්තාපල්වරුන් වන බණ්ඩාර (45865) සහ චන්දන (10385) යන මහත්වරු සහභාගී වූහ.

මෙම පුවත්පත් වාර්තාව කියවූ ඔබට හැඟෙන්නේ කුමක්ද? කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකිමි කියන සිල්පදයත් ඔබ තේරුම් ගන්නේ කාමරාගය නොහොත් ශරීර ස්පර්ශය කියා පමණයි. එයත් මොහයකි. මෙකී වසුපැටවුන්ගෙ මස් එලුමස් කියා අධික මුදලක් ගෙවා අරගෙන කන්නෙත් මාන්නය නිසායි. ''අනේ අපිනම් කවදාවත් හරක්මස් නම් ගෙදරකටවත් ගන්නේ නෑ. අපේ ළමයින්ට දෙන්න ඕනෑ නිසා එලුමස් ටිකක් හරි චිකන් (කුකුළුමස්) හරි තමයි ගේන්නේ.

එහෙමයි කියලා ගේන්නේ අලජ්ජ කම නොහොත් කෑදරකම නිසා සහ මාන්නය නිසා කියන කථාවකි ඒක. එළුමස් වෙනුවට තවත් බොහෝ ප්‍රදේශවල විශේෂයෙන් මහනුවර ආශ්‍රිත ප්‍රදේශවල දඩොරියන්ගේ මසුත් එළුකකුල් ඔලු අතර තබා විකුණන්නේය. කෙළ පෙර පෙරා මේවා කඩෙන් ගන්නේ ලොකු ජයග්‍රහනයක් ලෙසටය. මස්කඩ මුදලාලිත් තමන්ගෙ හිතවත් ගැනුම්කරුවන් පැමිණෙන විට දේශපාලනඥයින්ගේ සිනහව පාලා පිළිඅරගෙන විශේෂ සැලකිල්ලෙන් වසුපැටවුන්ගෙ හෝ බල්ලන්ගෙ මස් හොඳට ඇසුරුම් කරදී මුදල්ගෙන මුන්ගෙ මොලේ (නුවණ) තිබෙන්නේ කොහේද? කියා මෝහයෙන් නොහොත් මාන්නයෙන් හිස උදුම්මාගත් මාන්නාධිකයාට දී පිටත් කර යවයි. දරුවන්ගෙ නමින් ගෙනත් කන්නේ මේවාය. අවාසනාවන්ත දෙමාපියෝ තමන් යන වැරදි මාර්ගයට දරුවන් ද යොමුකරති.

කුකුල් මස් සොසේජස් ගැන කීමට තිබෙන්නෙත් එම කථාවමය. එනම් කුකුල් කොටුවල ඇති කරන කුකුලන්ට වසන්ගතයක් ඇති වී මැරෙන්ට ආසන්න වූ විට හෝ මැරුණුවිට මළමිනිය එම්බාම් කරන ආකාරයට පිරිසිදුකර ඇසුරුම්වලට දමා හෝ නොදමා වෙළඳපොලට නිකුත් කරයි. වෙළඳ පොළෙත් සත් ගුණවත් ළඟම පන්සල්වල දායක

මහතා දහස් ගණන් මුදල් ගෙවා විනිවිද පෙනෙන හෝ නොපෙනෙන අයිස් පෙට්ටිවල මාලු ලැල්ලෙමෙන් විදුලි බුබුළු දල්වමින් ප්‍රදර්ශණය කරමින් මොණර රූප තිබෙන මුදල් නෝට්ටුවලට හුවමාරු කරති. එම මුදල් නෝට්ටුවලින් කොටසක් බුද්ධ ශාසනය වෙනුවෙන් පන්සලේ දනයට, පින්කමට, අටවිසි බුදුරජාණන් වහන්සේලා වෙනුවෙන්, රන්වැට වෙනුවෙන් පුස්තකාලය වෙනුවෙන්, දන ශාලාව වෙනුවෙන් ආදී මෙකී නොකී පින්කම් වෙනුවෙන් වෙන්කරයි. විහාරාධිපති ස්වාමීන් වහන්සේ බල්ලො මරල හරි කමක් නෑ අපේ අවශ්‍යතාවයන් කෙරෙනවානම් සිතා, මෙපින් බලෙන් තව්තිසා දෙව් ලොව මහේශාක්‍ය දිව්‍ය පුත්‍රයෙක් වේවායි පතති.

ඒ දෙදෙනාම මැරුණුපසු උපදින්නේ අටමහ නරකාදිවල බැව් මොහය නිසාත් පිළි නොගනී. ඔවුන් ඒවා පිළිගත්තත් නොගත්තත් මරණයෙන් පසුව අතරමග රැඳීමත් නම් නොමැතිව මිනිසත් ආත්ම භාවයේ සිටිය දී සිතෙන්, කයෙන්, වචනයෙන් කර ගත්තාවූ පාප අකුශල කර්ම බලයට අදළ නරකාදිවල මෙතෙකැයි කිව නොහැකි කාල වකවානුවක් ගෙවෙන තුරු ඇසිපිය ගැසිල්ලක් තරම්වත් සැනසුමක් නැතිව යමපල්ලන්ගෙන් සහ කවුඩන්, උකුස්සන්, කිම්බුල්ලන්, පණුවන් ආදී සතුන්ට කාපු මස්මාලුවලට, විකුණු මස්මාලුවලට, ප්‍රාණඝාතය කරන ලද සතුන්ගෙ මස් ප්‍රමාණය මෙන් සිය දහස් වාරයෙන් ඇට, ලේ, මස් එකී නිරයන්හිදී පමණක් නොව ඉන්පසු උපදින තිරිසන් අපායෙහිදිත් වසුපැටියන්, දඩෝරියන් ලා සහ ඌරන්, කුකුලන් වෙලා ද ණය ගෙවන්නේය.

මෙසේ එම ණය මස්වලින් ගෙවා නිමවූ පසු අර දන්පින් කරගත්තා වූ කුසල් බලයෙන් තිරිසන් ආත්ම භාවයෙන් මිදීමට පෙර

අනුන්ගෙන් සැප සම්පත් ලබන බල්ලන්, බලලුන්, සර්පයන් ආදී සතුන් වී ඉපිද පින් බලයෙන් ආහාරපාන සැප සම්පත් විඳිමින් එම කුසල් බලය ද අහෝසි වූ පසු මිනිසත් ආත්ම භාවයක් ලබා ගත්තත් පින් මඳකමට මසුන් මරන්නන්, සුරාධූතයින්, අනුන්ගෙන් යැපෙන්නන් වහළුන්, කුලීකරුවන් ආදී පහත් කුලවල කක්ෂ ජීවිත ගෙවන්නන් වශයෙන් උපදී. බුද්ධ ධර්මයට, ශාසනයට, විනකරන්නවුන්ට නම්, තවත් අතිදීර්ඝ කාලයකට අටමහ නරකාදී වලින්නම් මිදීමක් නැත්තේමය, අටමහ නිරයන්ගෙන් මිදෙන බොහෝ සත්වයෝ බුද්ධ ශාසනයට කරන්නා වූ අගෞරවය වෙනුවෙන් අටමහ නිරයන්ගෙන් මිදුනු පසු උපදින්නේ ලොකාන්තරික නරකයෙහිය.

එහි උපදින සත්වයන් ගැන දීර්ඝ විස්තරාත්මක ලියූ පොත් තිබෙන නිසා මෙහි කෙටි විස්තරයක් සඳහන් කරමි. එනම් :- අපගේ සූර්යයාගේ ආලෝකය යම්තාක් දුරට පැතිරෙද්ද එයට කියනවා සක්වල කියා එවන් තවත් සක්වලවල් 2 ක් සමග සක්වළවල් තුනක් (ලිප්ගල් 3 ක්) අතරෙහි තිබෙන අප ජීවත්වන පෘතුවියමෙන් ලෝකයෙහි එහි අපට රාත්‍රි කාලයෙහි ඇතිවන්නා වූ අන්ධකාරයකි පවතින්නේ. එහි වසන එම සත්වයන්ට දිවා රාත්‍රියක් නොමැතිහෙයින් ද අන්ධකාරය බහුල හෙයින් ද දැස් නොපෙනේ. එකෙකුගේ ඇඟේ තවකෙක් ගැවුන තැනේදී මෙය ගොදුරක් යයි සිතා ගොදුරු ඩැහැ ගැනීමට යාමේ දී එල්ලී සිටින ගලෙන් දෙපාදය ඉවත්ව යොදුන් දෙලක්ෂ හතලිස් දහසක් පහතට වැටී ඉදුණු කොස් ගෙඩියක් බිමට වැටී කැලි කැඩී යන්නා සේ එම සත්ව ශරීරය සුනු විසුණු වී යන්නේය.

ඉන්පසු මෙම මිනිසත් ලෝකයෙ සිටි කාලයෙහිදී බුද්ධාදි රත්නත්‍රයට කලාවූ නින්ද අපහාස හා අකටයුතු දේ සහ මිත්‍යාදෘෂ්ටි

ගැනීමේ පාපකර්ම බලෙයන් එම කොටස් එක්ව නැවත නැවතත් පෙරසේම ප්‍රාණය ලැබ මුලින් සිටි ස්ථානයෙහිම කර්මය ගෙවෙනතුරු අනෙකවිධ දුක් විඳවමින් සිටින්නේය. මෙයාකාරයට මේ දහම් පොත සංස්කරණය කරන මම ද එසේ ම මේ සසර සැරිසරන්නා වූ අනෙකුත් සෑම සියලු සත්වයෝද එම නිරයන්හිදී අතීතයෙහිදී දුක් නොවින්ද එකම සත්වයකුදු නැත්තේය. මෙලොවදී එවන් පාපකර්මයන් කරන්නා වූ සෑම සත්වයෙකුටමත් එකී නිරයන්හි ඉපදෙමින් එයින් මිදී එන්නා වූ සත්වයන්ගෙ පුරප්පාඩු පුරවමින් එකී නිරයන් ද සදකල්හිම පවත්වන්නේය.

එසේ හෙයින් දුර්ලභව ලබාගත්තා වූ මෙම මිනිසාත්මභාවයත් සම්බුද්ධ ශාසනයත් පිහිටාධාර කරගෙන නැවත නැවත සසර දුකට පත්නොවී දුකින් මිදීම සඳහාම ක්‍රියාත්මක වීම පිණිසම සිතට ගලාඑන කිසිම පාප සිතිවිල්ලකට ක්‍රියාත්මක වීමට ඉඩනොදී එයින් මිදී ජීවත්ව සිටින කෙටිකාලය සසර දුකෙන් මිදීම පිණිසම තම තම හැකි පමණින් පින්දහම්වල නිරතවෙමින් ද බුද්ධ ධර්මය තම තමන්ට අවබෝධ නොවනු පළියට ඒ ගැන විචිකිච්ඡාවක් ඇති කර නොගෙන මෙම දේශනාවන් බුදුරජාන් වහන්සේ විසින් දේශනා කර තිබෙන්නේ අපට නොපෙණෙන ඉතා සියුම් ඥාන සම්භාරයක් ඇති නිසයි. එහි හොඳම උදහරණයක් වශයෙන් පහත සඳහන් කරුණු දෙස නුවණින් සිතා බලන්න.

ගොඩබිම වසන විශාල සත්වයා හැටියට අලියා ගණන් ගත්තත් හිමාල වනය ආශ්‍රිතව ඇත්කඳ ළිහිණියන් සිටින බව ඔබ අසා තිබේද? ඔවුන්ගේ ප්‍රධාන ගොදුර කුමක්ද? ඇත් කඳ ළිහිණියා ගොදුර ඩැහැගෙන අහසින් ගෙනයන්න තරම් එම සතා කොපමණ ශක්තිමත් වියයුතුද? කොතරම් විශාල වියයුතුද? එසේම ජලයෙ වසන තල්මසා මිහිපිට වසන

විශාලම සතා හැටියට කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවා එනමුත් අපට නුවණින් සිතා බලන්න එයට වඩා වෙනස් දෙයක් බුද්ධ දේශනාවේ සඳහන් වෙනවා ඒ ගැනත් සිතා බලන්න.

මේ පෘථුවිය කොටස් හතරකට වෙන් කලොත් එයින් කොටස් තුනක්ම ජලයට වෙන් වූ පසු එක් කොටසක් පමණයි. ඒ ඉතිරි කොටස තමයි. මේ පඤ්ච මහා ද්වීප වශයෙන් බෙදී තිබෙන්නේ. මේ පඤ්ච මහා ද්වීපවල විශාලත්වය කොපමණද? එවන් තුන් ගුණයක් විශාල සතරමහා සාගර කොතරම් විශාලද? කොතරම් ගැඹුරුද? එසේ නම් ඉහත පෙන්වූ ආකාරයට ගොඩබිම වසන අලියාට වඩා විශාල පක්ෂීන් සිටිත් නම් ජලයෙ වසන තල්මසා ගැනත් කිවයුත්තේ එසේමයි.

බුද්ධ දේශනාවේ සඳහන් මත්ස්‍යයන් පස්දෙනාගෙන් මේ අවස්ථාවේදී මට මතක තිබෙන්නේ ආනන්ද කියන මත්ස්‍යා ගැන පමණයි වෙනත් ධර්ම ග්‍රන්තයක එම මත්ස්‍යයන්ගෙ නම් සඳහන් ව ඇත. බුද්ධ දේශනාව මෙසේයි :-

මේ මහා සාගරය යොදුන් අසූහාර දහසක් ගැඹුරුය. (යොදුනක් සැතපුම් දහසයක් වශයෙන් ගැනේ) එයින් යොදුන් හතළිස් දහසක් මතුපිට ජලය කැළඹෙන සුළුය. එය භූමිකම්පා, වායුව විසින් කැළඹීම, දේව කෝප වශයෙන් මහෙශාක්‍ය දෙවි බලයෙන් ද (සමුද්‍ර වානිජ ජාතකය, විහාර මහා දේවියගෙ සිද්ධිය, ඉතා මෑත ඇතිවුනාවූ සුනාමිය) තවද තල්මසුන් වැනි මත්ස්‍යයන්ගෙ කැළඹීත් මෙන්ම මිනිසාගෙ නැව් ගමන් ආදි නොයෙක් ආකාරයෙ වතුර කැළඹීම් ආදිය නිසාය. එම මතුපිට යොදුන් හතළිස් දහසෙන් පසුව තවත් යොදුන් හාරදහසක් යටට වතුර කිසි හැලහැප්පීමක් නැතිව ඉතා නිසොල්මනේ පවතී. එයින් යට ඉතිරි යොදුන් හතලිස් දහස ද ජලය කැළඹිලි සහිතය.

එනම් එහි වසන මත්ස්‍යයන්ගෙ ශරීර ප්‍රමාණයන් අනුවත් යට ජලයෙ කැළඹීම් අනුවත්ය. එහි වසන මත්ස්‍යයන්ගෙ දිග යොදුන් 600-700-800-900-1000 වශයෙන්ය. එයින් යොදුන් දහස දිග මත්ස්‍යයා ආනන්ද නම් මසුන් වර්ගයාගෙ රජතුමාය. මේ ශ්‍රී ලංකාද්වීපයෙහි දිග පළල කොපමණ ද ඒ අනුව සිතාගන්න එම සතුන්ට අවිද්‍යාවෙන් පිරුණු අප විශාලම සතා වශයෙන් ගණන් ගැනෙන තල්මසා බලයෙක් කෙළවල්ලෙක් වැනි සතෙකුට ගොදුරුවන හුරුල්ලෙක් තරම්වත් වේද? එය අප බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙන් බුදුරැස් මාලාවන් ප්‍රථමයෙන්ම විහිදුවීමට හේතු කාරණාව වශයෙන් මෙසේ දක්වා තිබේ.

එද ජය ශ්‍රී බෝධිමූලයේ දී සම්මා සම්බුද්ධ රාජ්‍යයට පත්ව සතියක් ගෙවන තුරුත් ශරීරයෙන් බුදුරැස් විහිදීමක් සිදුවූයෙත් නැත. එවිට දෙවියෝ තවම බුදුබවට පත්ව නැතැයි සැක පහළ කල නිසා එම සැකය නැති කිරීම පිණිස අහසට නැග පලක් බැඳ වැඩ සිට සැකය දුරු කළ සේක. දෙවන සතියෙහි අනිමිස ලෝචන පූජාවෙන් සිටි අවස්ථාවෙත් බුදුරැස් විහිදුනේ නැත. තුන්වන සතියෙහි සක්මනෙහි යෙදී සිටියදීත් බුදුරැස් විහිදුනේ නැත. එනමුත් පළමුවන සතියෙහිදී අනන්ත අප්‍රමාණ සක්වළවල් දෙස බලා මේ මගුල් සක්වල හැර වෙනත් කිසිම සක්වලක බුදු රජාණන් වහන්සේ නමක් පහළ නොවන බවත් මම මෙසා දීර්ඝ කාලයක් මෙසා දුකක් විඳ ලොවුතුරා බුදුබවට පත්වූයේ, සියලුම සත්වයන් සසර දුකින් මිදවීම පිණිසයි. එම නිසා දස දහසක් සක්වලවල් වලින් පිට සත්වයන්ට කාගේ පිළිසරණක් ද'යි සිතා සිතින් අධිෂ්ඨාන කරමින් අද මේ මොහොත දක්වාත් නොනැවතී ගමන් කරන බුදුරැස් මාලාවක් නිකුත් කළ බැව් පැරණි පූජාවලිය පොත් වහන්සේගේ සඳහන්ය.

සතරවන සතියෙහිදී දෙවියන් විසින් මැව් රුවන්ගෙයි වැඩසිටිය දී තමන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය මෙනෙහි කරත් කරත්ම මහත් සන්තෝෂයට පත්වන්න වන්නම මුළු ශ්‍රී ශරීරය තුළින්ම බුදුරැස් විහිදීම ආරම්භ වූ සේක. එය උපමාවකට ලක්කර තිබෙන්නේ යට යොදුන් හතළිස් දහසේ සිටින යොදුන් සිය ගණන් දිගැති මත්ස්‍යයන් සිතැගි ලෙස ක්‍රීඩා කරන්නේ එකී අතිවිශාල මහා ජලසාගරයෙහි පමණක්ය යනුවෙනි. එයාකාරයට අප බුදුපියාණන් වහන්සේටත් සතරවන සතියෙහි ගත කල රුවන් ගෙයත් එකී මත්ස්‍යයන්ට තිජබිම වූ යට ජල සාගරය සේය. මේවා කවුරු පිළිගනිත් ද? කෙසේ අවබෝධ කරගනිත් ද? බුද්ධිමතා මෙම බුද්ධ දේශනාව පිළිගනී පෘත්ගජනයා කෙසේ අවබෝධ කර ගනිත්ද? මෙම පෘතුවිය ඇතුළත තිබෙන අටමහ නරකාදීත් එසේ මය.

ඒවා පිළිගනිත් නම් තමාගෙ ජීවිතය පවත්වාගෙන යාමට නොව පෙනී පෙනී මරණය ආවත් කටට රසට එළුමස් කියා වසු පැටවුන්ගෙ සහ දඬොරියන්ලාගෙ මස් නොව උම්බලකඩ කැල්ලක් හාල්මැස්සෙක්වත් මිහිරි රසැති බිත්තර යෙදූ රස කැවිල්ලක්වත් ප්‍රාණඝාතය බියට නොගන්නේය. එයාකාරයටම අනුන්ගෙ දෙයක් සොර සිතින් ගන්නවා තබා ආශාවක්වත් සිතන්නේ නැත. එසේම කාම රාග සිතක් සිතට ආ සැනින් එය පිළිකුලට මෙනෙහි කර වරදෙහි බැඳෙන්නේද නැත. එසේම විහිලුවටවත් බොරු කීම, කේළාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම සහ වැරදි ජීවිකාවෙන් ද වළකින්නේය.

මෙතෙක් අපි අලියාට තල්මසාට වඩා ලොකු සත්වයන් නැතැයි සිතා සිටි සිතුවිල්ල අපි සැවොම දන්නා මෙම මිනිසත් ලෝකයේ ඇස් පනාපිට තිබෙන දේවල්ය. දිවා කාලයෙහි අහසේ තාරකා නොපෙණෙන නිසා එවන් දේවල් නැතැයි සිතන්නා සේ, බුදුරජාණන් වහන්සේගේ

ස්වයං භුඤ්ඥනයට අසුනොවන අනන්ත ලොකධාතු සහ සත්වයාගෙ සසර ගමන පිළිබඳව දේශනා කර වදරණ ලද ධර්මය කෙරෙහි විචිකිච්ඡාවක් ඇතිකර ගෙන නිවණ දුරස්කර නොගන්න. බුදු බව පතා උත්තමයෝ අනන්ත කාලයක් අප්‍රමාණ දුක් විඳින්නේ සසර සැරිසරණා සත්වයා එම දුකින් මුදවා තමන් වහන්සේ ද සසර දුකින් මිදීම පිණිසමය.

එමනිසා තම තමනුත් රස තෘෂ්ණාවට වහල් නොවන්න. මේ රස තෘෂ්ණාවට වහල්වීම නිසා තමයි අධික මිල ගණන් ගෙවා මස් මාලු බිත්තර ආදියට මුදල් ගෙවීමෙන් ප්‍රාණඝාතයට අනුබල දෙන්නේ, විසිපස් ආකාරයකින් හොරකමට යොමුවන්නේ එසේම ලෝ පුරා මේසා කාමරාග අපරාධ කෙරෙන්නේ මත් වතුරට ගිජු නිසා තමයි බොරු කීම, පරුෂ වචන කීම්, පවට ලජ්ජා භිය නැතිය මෙකී සියලු අපරාධයන්ට පොළඹවන්නේ, එයින් නිවණ දුරස්වන අතරම අනන්ත අප්‍රමාණ කාලයන්හි සතර අපා දුඃඛයන්ට ගොදුරුවන්නේය.

ඉහත කී ගව පැටවුන් තිස්දෙනා සේමයි ජලයෙ වසන මත්ස්‍යයොත් තිස් අවුරුදු යුධ සමයෙ අපගේ මායිම් ගම්වලට එල්.ටී.ටී. සාමාජිකයන් පැමිණ දරු පවුල්පිටින් විනාශ කර මළ කඳන් දමා ගිය ආකාරයට තමයි මුහුදු, වැව්, පොකුණු ආදියෙහි ඉපිද වැඩී ජීවත්වන සතුන් මරා ඔවුන්ගෙ මළකුණු ආදියෙහි ඉපිද වැඩී ජීවත්වන සතුන් මරා ඔවුන්ගේ මළකුණු රැගෙන එන්නේ. ඒවා කරන්නේ ජීවත්වීමට දරු පවුල් නඩත්තු කිරීමට වෙන ක්‍රමයක් නැති නිසයි කීවත් එය නිදහසට කාරණයක් නම් නොවෙයි. ගොඩබිම වසන සතුන් වන අලියා, ගවයා, එළුවා ආදි සතුන් තෘණවර්ග ආහාරයට ගත්තත් නපුරු චණ්ඩ සිව්පා සතුන්ට ද එසේම සර්පයන්ට ද ජන්මයට වඩා පුරුද්ද ලොකුයි කියන්නා සේ සසර පුරුද්ද නිසා එවන් රැකියා සඳහාම සිත යොමු කරවන්නේ

පාපකම් සිතිවිලි නිසා දුර්ලභව ලබාගත්තා වූ මිනිසත් භාවය නැවත නැවතත් අපාදුකට හෙළීම සඳහා ය.

එවන් පාප සිතිවලින් මිදෙන්න මාගෙ ජීවිතය කුරා කුහුඹුවෙකුටවත් හිංසාවක් පීඩාවක් බරක් බවට පත්කර නොගනිමි. සෑම සත්වයෙක්ම මාසේම ඔවුන්ගෙ ජීවිතය ආරක්ෂා කර ගැනීමට මහත් දුකක් විඳිති. මට පැමිණෙන වේදනාවට බියට දුකට මම අකමැතිවා සේම හාල්මැස්සාගෙ සිට තල්මසා දක්වා ද බිත්තරයෙන් එළියට පැමිණියා වූ සත්වයාගෙ පටන් අලියා දක්වාම ජීවිත බිය නිසා තමයි අලියෙකුගෙ කකුලක් තරම් නැති මිනිසාගෙ අතෙ තිබෙන හෙණ්ඩුවට බයේ මිනිසාගෙ වහල් වැඩ කරන්නේ. එවන් අපිට භය සතුන් මැරීම, හිංසා පීඩා කිරීම, එසේ මැරුණු සතුන්ගෙ මළකුණු කිරට මිරිසට රසට කෑමට කෑදර වන්නේ තමාගෙන් නොනැවතී තම පවුලට එකතුවන දරුවාවත් ඒවාට ඇබ්බැහි කරගන්නේ වැඩුණු හරකාගෙ මසුත් කනවා, කිරිත් බොනවා, වසුපැටියාගෙ මසුත් කනවා, කිකිළියත් මරා හෝ මරවාගෙන කනවා බිත්තරත් කනවා මේවා ගැන නැවත සිතන්න.

මෙතෙක් පෙන්වා දෙන ලද මෙම දහම් ග්‍රන්ථය ප්‍රමාණවත්යයි සිතමින් මෙයින් නවතිමි. ඒ සමගම ක්‍රි. වර්ෂ 2001 අප්‍රේල් මස 30 ද බුදුසරණ පුවත්පතේ තිබෙන ලිපියක් සමගම ධර්ම ග්‍රන්ථය නිම කරන අතරම මෙම දහම් ග්‍රන්ථයන් සඳහා අනුග්‍රහයකයන් නොමැති නිසා තිබෙන මූලික මුදල යොදවා සම්පාදනය කරවා යම්කිසි මුදලක් අය කරගන්නේ එම මුදල් වලින් තව තවත් මෙවන් ධර්ම ග්‍රන්ථ සඳහා ය.

මීට මෙතැති,

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

දක්ෂිණ ලංකා තිස්ස විහාරය, සිඟුජයපුර,

කිරින්ද.

# නිර්මාංශ ආහාර පිළිවෙත 'අත්තකිලමථානු යෝගයක්' නොවේ

ඉඳුරන්ට ප්‍රිය අරමුණු ලබා දෙමින් ඉඳුරන් පිනවීම කාමසුඛල්ලිකානුයෝගයයි. ඇස පිනවන රූප, කණ පිනවන ශබ්ද නාසය පිනවන සුවඳ, දිව පිනවන රස, කය පිනවන පහස, සිත පිනවන සිතුවිලි ලබාදීම කාමසුඛල්ලිකානුයෝගී පුද්ගලයාගේ ඒකායන අරමුණය. මෙයට පටහැනි පැවැත්ම අත්තකිලමථානු යෝගයයි. කාම සුඛල්ලිකානු යෝගය අගයන පුද්ගලයා ඉඳුරන් පිනවීම පරම සැපය සේ සලකයි. ඇස, කණ, නාසය, දිව, ශරීරය, සිත යන ඉඳුරන් ප්‍රිය අරමුණු ඉල්ලන විට ඒ අරමුණු ලබා නොදී ඉඳුරන් මැඩ පවත්වා ඉඳුරන්ට දඬුවම් දී, ඉඳුරන්ට රිදවා කෙලෙස් මැඬීමට අනුගමනය කරන නිරර්ථක පීඩාකාරී පිළිවෙත අත්තකිලමථානු යෝගයයි.

ඉඳුරන් පිනවීම කාමසුඛල්ලිකානු යෝගයයි. ඉඳුරන්ට වධදීම අත්තකිලමථානු යෝගයයි. මේ ක්‍රම දේකම සැප ලැබීමේ සැබෑ පිළිවෙත් මාර්ග නොවන බව බෞද්ධ ඉගැන්වීමයි. ඒ ක්‍රම දෙකෙම සත්‍යය නොදක මිසදිටු පදනම් මත බිහිවූ අන්තවාදී පිළිගැනීම්ය. මේ අන්ත දෙකම ප්‍රථම දේශනාවෙන්ම ප්‍රතික්ෂේප කළ සර්වඥයන් වහන්සේ ආර්ය සැප ලැබීමේ මැදුම් පිළිවෙත් මග අනාවරණය කළහ. එය ඉඳුරන් පිනවීමේ ක්‍රමයක් නොවන, ඉඳුරන් මැඩ පැවැත්වීමත් නොවන ප්‍රඥාව පදනම් කරගත් ක්‍රමයකි. ඒ උතුම් මැදුම් පිළිවෙත් මුලටම ඇත්තේ සම්මාදිට්ඨිය නමින් හැඳින්වෙන සැබෑ නුවණයි. එබැවින් එය නුවණ පෙරටු කොට සැකසුණු ආර්ය මාර්ගයකි.

## තණ්හාව දුරලන පිළිවෙතක්

සම්මා දිට්ඨියෙන් ඇරඹෙන තිවන් මාර්ගයේ ඊළඟ අංගය සම්මා සංකප්පයයි. එහි පළමුවැනි සංකල්පය නෙක්ඛම්ම සංකප්පයයි. එනම් නික්මීමේ සංකල්පයයි. ඒ ඉඳුරන් පිනවීමෙන් නික්මීමයි. අනිත්‍යය වූ, දුක්ඛ වූ, අනාත්ම වූ ඉඳුරන් පිනවා සැප ලැබීමට මැදුම් පිළිවෙතට අනුව අගයක් දී නැත. ජීවිත නසා ලබාගත් මස් මාංස අනුභව කොට දිව පිනවීමට මේ සංකල්පය අනුව අවකාශ නැත. අනෙක් සංකල්පය අවිහිංසා සංකප්පයයි. කාරුණික සංකල්පනාවන්ගෙන් යුක්තවීම අවිහිංසා සංකප්පයේ අදහසයි. කාරුණික විය යුත්තේ තමන්ට සහ සෙසු සත්වයන්ටය. තමන්ට වද වේදනා පමුණුවා ගැනීමට හෝ සතුන් මරා ලබා ගත් මස් මාංශ අනුභව කිරීමට අවිහිංසා සංකල්පය අනුව අවකාශ නැත. අනෙක් සංකල්පය අව්‍යාපාද සංකල්පයයි. එහි අදහස බෞද්ධයා මෛත්‍රී සහගත සංකල්පාවෙන් යුක්ත විය යුතු බවය. සියලු සත්වයන් තමන් හා සමාන කොට සලකා ඔවුන්ගේ හිත සුව කැමතිවීම මෛත්‍රී සංකල්පනාවේ ස්වභාවයයි. එම සංකල්පනාව වැඩි දියුණු කිරීමේ නිරතවිය යුතුය. බෞද්ධයා කිසිසේත් මස් මාංශ අනුභව කරන්නකු විය නොහැකිය. ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු බෞද්ධයාගේ ගමන් මග හෙවත් බෞද්ධ ජීවිතයක තිබිය යුතු අංග අටයි. ඒ අංග තම ජීවිතය තුළ දියුණුකර ගැනීම බෞද්ධයාගේ කාර්ය භාරයයි. සත්වයන්ට කරුණාව, මෛත්‍රිය දියුණු කිරීමෙහි නිරත විය යුතු බුද්ධිමත් කෙනකුට ජීවිත නසා ලබා ගත් මස් මාංස අනුභව කිරීම, සිහි නුවණින් යුතුව කළ නොහැකිය.

## 'මර්ධනය' නොවේ - සංවරයයි

බුදු දහම මග පෙන්වන්නේ ඉඳුරන් පිනවීමට නොව කරුණු දැන අවබෝධයෙන් යුක්තව අවශ්‍යතා ඉටුකර ගැනීමටය. ආහාර අවශ්‍ය කුමකටද යන්න නුවණ මෙහෙයවා තීරණය කළ යුතුය. එසේම ඇඳුම්,

වාසස්ථාන, ගෘහ උපකරණ, බෙහෙත් ආදිය අවශ්‍ය වන්නේ කුමක් පිණිසදැයි හේතු විමසා බලා තේරුම් ගත යුතුය. මෙය ධර්මයෙහි සඳහන් වන්නේ 'ප්‍රත්‍යවේක්ෂාව' යන නමිනි. ඒ අනුව බුදු දහමට අනුව යමක් අවශ්‍ය හෝ අනවශ්‍ය බව තීරණය වන්නේ කරුණු තේරුම් ගෙන අවබෝධයෙනි. කරුණු තේරුම් ගෙන අවබෝධයෙන් කටයුතු කිරීමේ දී ඉඳුරන් මර්දනය කිරීමක් නැත. එහි ඇත්තේ ඉඳුරන් දමනය කිරීමකි. ඉඳුරන් සංවර කර ගැනීමකි. එහි පදනම අවිද්‍යාව හෝ අන්ධානුකරණය නොව අවබෝධයයි.

මෙලෙස ඉඳුරන් දමනය කිරීමේදී වැරැදි කිරීමේ ආදීනව පක්ෂය ද සොයා බලයි. එය වරදින් මිදීමට බෙහෙවින් උපකාරී වෙයි. මේ පදනම නිසා සුරාපානය, මුසාවාදය ආදී වැරැදිවලින් වළකියි. එහෙත් සුරාපානයෙන් වැළකීම අත්තකිලමථානු යෝගයට අයත් නොවේ. යම් කෙනෙකු ඉඳුරන් බලයෙන් මර්දනය කොට වරදින් වැළකීමට උත්සාහ කරන්නේ නම් අත්තකිලමථානු යෝගයට අයත්විය හැකියි. බොහෝ අය මස් මාංස අනුභවයෙන් වැළකී නිර්මාංසාහාරයෙන් ජීවන පැවැත්ම සකස් කරගෙන ඇත්තේ සත්ව අනුකම්පාව පදනම් කරගෙනය. මාංස ආහාරය සත්ව ඝාතනයට හේතු වෙයි. ඒ සත්වයන් ද මා මෙන්ම ජීවිතයට ප්‍රියය යනාදී වශයෙන් දූරදර්ශී අයුරින් කල්පනා කරන සානුකම්පිත හැඟීම් ඇති අය මාංසාහාරයෙන් වළකිති. අනුන්ගේ මස් අනුභව කොට දිව පිනවීමේ පහත් රුචිකත්වයක් ඔවුන්ට නැත. අපට වරදක් නොකළ නිර්දෝෂී අහිංසක සතුන්ගෙ ජීවිත අමානුෂිකව විනාශ කොට ලබාගත් මසකින් තම ශරීරයේ මස් ප්‍රමාණය තර කරගැනීමේ අදූරදර්ශී, ආත්මාර්ථකාමී, හිංසක චේතනාවක් ඔහුට නැත. ඒ නිසා හේ නිර්මාංස වෙයි. එහි ඇත්තේ අනවබෝධයෙන් හෝ අන්ධානුකරණයෙන් ඉඳුරන් මර්දනය කිරීමක් නොව කරුණු තේරුම්ගෙන ඉඳුරන් දමනය කිරීමේ පිළිවෙතකි. එහෙත්

අභාග්‍යයකට මේ තතු නොදත්, ඉඳුරන් පිනවීමට ලොල් වූ ආත්මාර්ථකාමීහු නිර්මාංස ආහාර පිළිවෙත අත්තකිලමථානු යෝගයක් සේ හෙළා දකිති. සත්ව ජීවිත විනාශ කිරීමට, හිංසාවට අනුබලයක් වන එවැනි ප්‍රකාශ බෞද්ධකමට කිසිසේත් යෝග්‍ය නොවේ. සත්ව ජීවිතවල පැවැත්මට හානිකර දිවි පැවැත්ම වැරැදි බව සම්මා ආජීව මාර්ගාංගයෙන් ද පැහැදිලිය. එබැවින් එවැනි ප්‍රකාශ තුළ ඇත්තේ බෞද්ධ විමුක්ති මග පිළිබඳ ඔවුන් තුළ ඇති අනවබෝධයයි.

## විකෘති අදහස් තවත් එයි

එවැනි දුර්මත සමාජය තහවුරු වුවහොත් සතුන් මැරීමෙන් වැළකීම, සොරකමින් වැළකීම, කාම මිථ්‍යාචාරයෙන් වැළකීම, බොරුවෙන් වැළකීම, පරුෂ වචනයෙන් වැළකීම, සුරාවෙන් වැළකීම, සූදුවෙන් වැළකීම සම්මා ආජීවයෙන් දිවි පැවැත්ම පවා අත්තකිලමථානු යෝගයට අයත් යැයි ඉදිරියේදී තර්ක කිරීමට පුළුවන. කරුණු දැන ඉඳුරන් දමනය වීම හෙවත් සංවරය අත්තකිලමථානු යෝගය නොව නිසි බෞද්ධ ප්‍රතිපදාව බව තේරුම් ගත යුතුය. එය ඉන්ද්‍රිය සංවරශීලය නමින්ද බුදුදහමේ ඉගැන්වෙන බව අමතක නොකළ යුතුය. අන් අයගේ මස්, මාළු අනුභව කොට ජීවත්වීමට තැත් කිරීම මිනිස්කම නොව ඇතැම් තිරිසන් සතුන්ට සහ රකුසන්ට හිමි ආවේණික අංගයක් බව තේරුම්ගෙන සත්වානුකම්පාව පෙරදැරිව සියලු සතුන් කෙරෙහි මෛත්‍රියෙන් යුක්තව මාංසාහාරයෙන් වැළකිය යුතුය. නිර්මාංස ආහාරයෙන් දිවි ගෙවමින් සියලු සත්වයන්ට දිවිහිමියෙන්ම අභයදානය පිරිනැමීම, අපේ යුතුකම ය.

## එදා පිරිසිදු සාංඝික දානය

මෙයට දශක තුනහතරකට පෙර අපේ ගම්බද ප්‍රදේශවල සඟසතු දානකට මස්, මාංස, කරවල, උම්බලකඩ, බිත්තර ආදිය සම්බන්ධ කළේ

නැත. එද සඟ සතු දනය නිර්මාංස දනයක් විය. එද දනය සුවඳය. ඒනිසා දනේ සුවඳ කාටත් හොඳට දැනුණේය. සඟසතු දනයේ ඒ සුවඳ අද නැත. එය අද බොහෝවිට මළකුණු දුගඳ ය. අපවිත්‍ර ය.

අදත් පෙහෙවස් රකින උපාසක පිරිසට පිරිනැමෙන්නේ නිර්මාංස දනයකි. එහෙත් කෝටියක් සංවරශීලය රකින භික්ෂූන් වහන්සේට මස්, මාළු පුදති. අනුන්ගේ මසක් දන්දීමට තමන්ට අයිතියක් නැති බව ඔවුහු නොදනිති.

ජීවිත නසා ලබාගත් මස්, මාළු අනුභව කොට පින්දීමට හැකිදැ'යි පැවිදි පක්ෂය ද නොසිතති.

## දුක හා බැඳි කාම වේදනා

ඇතැම් භික්ෂූහූ මස්, මාළු ඉල්ලති. එහෙත් ඉල්ලන හැම දේම දීමට දයකයන් සූදනම් විය යුතු නැත. දිය යුත්තේ ජීවිත නසා අධාර්මිකව ලබාගත් අපවිත්‍ර මළකුණු නොව දැහැමින් උපයාගත් පිවිතුරු දන වස්තුන්ය. මස්, මාළු අනුභවයට භික්ෂූන් වහන්සේ හුරුකොට තමන් කරන වරදට උන්වහන්සේ සම්බන්ධ කර ගැනීමට ඇතැම් දයකයන් කැමැතිය. මත්පැන් පානය කරන පුද්ගලයාගේ කැමැත්ත මත්පැන් පානය කරන පිරිස වැඩිවනු දකීමය. ඒ නිසා මසට ගිජු ගිහියෝ භික්ෂූන් වහන්සේට මස්, මාළු දන්දෙති. එහෙත් පිරිනමන ඕනෑම දෙයක් බාර ගැනීමට ස්වාමීන් වහන්සේද සූදනම් විය යුතු නැත. එමෙන්ම අපේ ස්වාමීන් වහන්සේ රස තෘෂ්ණාවට වහල්ව ගිහි සමාජයට වැරැදි ආදර්ශ නොදිය යුතුය.

දිවට දැනෙන රසයෙහි ඇත්තේ වින්දනයකි. ''වින්දන'' සඳහා ධර්මයෙහි සඳහන් වන්නේ ''වේදනා චෛතසිකය'' යන නමයි. එබැවින් විඳීම සිතෙහි හට ගන්නා ධර්මතාවයකි. වේදනාවෙහි යථාර්ථය නොදැන ඊට මුලාවීම නිසා සැප වේදනාවෙහි යථාර්ථය නොදැන ඊට මුලාවීම නිසා සැප වේදනාවෙහි ඇලෙයි. අම්හිරි වේදනාවෙහි ගැටෙයි. ඇලීම සහ ගැටීම හෙවත් තණ්හාව සහ ද්වේෂය නිමක් නොපෙනෙන සසර දුකට හේතුවෙයි. එබැවින් වේදනාවෙහි ඇති තතු තේරුම් ගැනීම වැදගත් අවශ්‍යතාවයකි. වේදනාව ධර්මයෙහි දිය බුබුලකට උපමා කර ඇත. දිය බුබුල හට ගනී. හට ගත්දිය බුබුල පවතින්නේ භ්‍රමණය වෙමිනි. එලෙසින් වුවද වැඩි කලක් පැවැතීමට ඊට අවකාශ නැත. ඊළඟ වැහි බිඳුව පතිත වන විට තිබූ දිය බුබුල විනාශ වී අලුත් දිය බුබුලක් හට ගනී.

දිය බුබුලේ මතුපිට හැඩය චමත්කාරය. එහෙත් ඇතුළත හිස්ය. එබැවින් දිය බුබුල හරයක් නැති, අතිශය දුබල දෙයකි. වේදනාව ද දිය බුබුලක් බඳුය. එය මතුපිටින් අගනා දෙයක් සේ සැලකේ. එහෙත් වේදනාව මමත්වයෙන් ගත නොහැකි හිස් දෙයකි. වේදනා ලැබෙන්නේ ඉඳුරන්ට අරමුණු හමුවීමෙනි. වැහි බිඳු නිසා උපන් දිය බුබුල වෙනත් වැහි බිඳු නිසා විනාශ වේ. ඒ සමඟ වෙනත් දිය බුබුලක් හටගනී. ඇසට රූපයක් හමුවීම නිසා ඇතිවූ සැප, දුක් හෝ උපේක්ෂා වේදනාව වෙනත් රූපයක් දැකීමෙන් හෝ ශබ්දයක් ඇසීමෙන් හෝ රස නීරස දැනීමෙන් හෝ පහස ලැබීමෙන් හෝ සිතිවිල්ලක් ඇතිවීමෙන් හෝ වහා අතුරුදහන් වෙයි. ඒ සමගම අතරක් නැතිව වෙනත් වේදනා හටගනී. වේදනා මෙලෙස ගණනය කළ නොහැකි වේගයකින් ඇතිව නැතිවන හෙයින් සැප වේදනා සෙවීමේ නිමක් නැති නිරර්ථක අරගලයක සත්වයා පැටලී සිටී.

එබැවින් අධර්මයෙන් පවා සැප වේදනා සෙවීමට බොහෝ අය පෙළඹී සිටිති. ලොවේ ඇති උත්තරීතර අයිතිය වන ජීවත්වීමේ අයිතිය අහිමි කොට මස්, මාංස, කරවල, උම්බලකඩ ආදිය අනුභව කිරීමට ගිජුවී එය උත්සන්න වී ඇත්තේ දිව පිනවීමට ඇති තෘෂ්ණාව නිසාය. මෙයද නිමක් නොපෙනෙන සැප ලුහුබැඳ යෑමකි. සැප වේදනාවේ යථාර්ථය නොදක "මම සැප විඳිමි" යන මුලාවෙන් යුක්තව සැප සොයයි. බුදුරදුන් හීන වූ ග්‍රාම්‍ය වූ, පෘථග්ජන ආදී වශයෙන් ආදීනව දක්වා බැහැර කළ මේ කාම සුඛල්ලිකානුයෝගී පැවැත්ම සැබවින්ම සැපයක් නොව දුකම සෙවීමකි.

තමන් විතරද ජීවත් වෙන්න ඕන?

ජීවත්වීමට ආහාරය අවශ්‍යය. ජීවත්වීමේ අවශ්‍යතාව සඳහා කෙලෙස් නූපදින ආකාරයට නුවණ පෙරදැරිව ආහාරය පිළිබඳ පිළිවෙත් අනුගමනය කළ යුතුය. සියලු සත්වයෝ ආහාරයෙන් යැපෙති. එබැවින් ඕනෑම කෙනකුට ජීවත්වීමට ආහාරය අත්‍යවශ්‍යය. ආහාරය යනු සියලු දෙනාගේ මූලික අවශ්‍යතාවකි. ජීවත්වීමේ අයිතිය යනු සියලු මූලික අයිතිවාසිකම් අභිබවා ගිය ඒවා හා සැසඳීමට නොහැකි ලෝකයේ ඇති ප්‍රධානම අයිතියයි. ඊට වඩා වැඩි ශ්‍රේෂ්ඨ අයිතියක් ලොවේ නැත. එබැවින් ඕනෑම කෙනකුගේ ජීවත්වීමේ අයිතිය උත්තරීතර අයිතිවාසිකමය. ඕනෑම කෙනෙකුගේ ජීවිතයට වඩා උතුම්, පූජනීය හෝ වටිනා කිසිවක්, අන් කිසිම දෙයක් ඔහුට නැත. එබැවින් තමාගේ ජීවිතය මෙන්ම සියලු සත්වයන්ගේ ජීවිත උතුම් බව තේරුම් ගත යුතුය. එබැවින් ආහාරය නැමැති මූලික අවශ්‍යතාව ඉටුකර ගැනීම සඳහා කවරකුගේ හෝ ජීවත්වීමේ අයිතිය අහිමි කිරීම, බලවත් අනුවණ කමකි.

අපට ආහාරය අවශ්‍ය කුමක් පිණිස ද? යන ප්‍රශ්නය ආහාර අනුභව කිරීමට ප්‍රථම තමාගෙන්ම විමසීම ඉතා වැදගත් කරුණකි. එයට ලැබෙන පිළිතුර ''ජීවත්වීමට'' යන්නයි. එසේ නම් අප මෙන්ම ජීවත්වීමට වෙර දරන සත්වයකුගේ ජීවත්වීමේ අයිතිය අහිමි කොට ලබාගත් යමක් තම ආහාර බඳුනේ තිබේද'යි විමසිලිමත්වීම ඤාණාන්විතය. තම ජීවිතය පවත්වා ගැනීමට වෙනත් ජීවිත බිලි ගැනීම යෝග්‍ය'දැයි තීරණය කිරීම රස තෘෂ්ණාවට නොව බුද්ධියට බාර කළ යුතුය.

හාලිඇළ
**ටී.බී. දිසානායක** විසිනි.

# නවක උපසපන් වන ගරු හිමිවරුනි

## අඹගල ධම්මරංසි නාහිමි

## (1989.06.03 බුදුසරණ)

පස්කම් සුවය මහණෙනි අතහැරිය යුතුයි
දූධි දුක් දෙවන තපසෙන් නිති මිදිය යුතුයි
මැදුම් පිළිවෙතෙහි හරි මග සිටිය යුතුයි
සුගතිඳු අපට දෙසූ වග අප සිතිය යුතුයි

අත්තුක්කංසනය පරවම්බන ආදී
ලාමක පවිටු ගති නැති සක්තිය වාදී
උජුපටිපන්න සාමිචිපටිපන් නාදී
පිළිවෙත එද සවුනගෙ අරහන් තාදී

වත්තු කුත්ති අනුසා සීමා පරිස
පිවිතුරු කොට මේ පස් කරුණින් මනස
ඔබ අදි සීලයට පත් වී එන දවස
දෙවියොත් ලබන්නට එති ඔබ පා පහස

උපසම්පද හිමිවරු වැඩ සිටින තුරු
සම්බුදු සසුන පවතී යනු දෙසුව යුරු
විනය පොතේ ඇති බණ පදයකි ගැඹුරු
එය සිහි කරනු ඔබගේ දිවි තිබෙන තුරු

නවක උපසපන් වන ගරු හිමි වරුනි
කුඩා සිකපදය මුත් නොකැඩෙන යුරිනි
හොඳ සිල්වතෙක් ලෙස හැසිරුනහොත් එයිනි
මවුපිය දෙපොලහට ඔබ කප්රුකෙක් වැනි

උපසපන් බවට පත්වනු ඔබම නිසා
ගුරු හිමි සතුට කොතරම් දැයි බලනු අසා
මවුපිය සොයුරු නෑසියො තුළ ඇති සතොසා
මොන වචනයෙන් දෝ පවසනුයේ කෙළෙසා



විහාරමහා දේවි ගොඩබට කිරින්ද චෛත්‍යරාජයාණන් වහන්සේ

මුද්‍රණය : තිරසවි ප්‍රින්ටර්ස් 0112 569192, 077 9620359